# විද්‍යාව ප්‍රචලිත කිරීම:
# විද්‍යා ලේඛක කාර්යභාරය

*මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන්*

විද්‍යාව අනුසරණය කිරීම හෙවත් ඒ පසුපස හඹා යෑම මේ මෑතක් වන තුරු-මෙයට පරම්පරා තුනක් තරම් වූ මෑත කාලය දක්වා සලකනු ලැබූයේ මහත්මා දාර්ශනිකයන් හෝ ස්වභාවවාදීන් හෝ විසින් පමණක් සිදු කළ යුතු කාර්යයක් ලෙසය. එය සමස්ත ඥානාන්විත හඹායාමේ අංගයක් ලෙස මෙන්ම මනසට අභියෝගයක් සපයන්නට සමත් වූවක් වශයෙන් ද සිත්ගන්නා සුළු විනෝදාංශයක් ලෙස ද සලකනු ලැබිණ. මෙන්ඩල් සහෝදරතුමා ක්‍රිස්තියානු පූජකවරයෙකු ලෙස නිරත වූ සිය ජීවිතයේ ප්‍රමුඛ කාර්යයට අමතරව පැළෑටියේ ජාන විද්‍යාත්මක පසුබිම පිළිබඳව ද විමසිලිමත්ව බැලීමට යොමු විය. වංශවතෙකු වුවද චාර්ල්ස් ඩාර්වින් භූ විද්‍යාව සහ ජීව විද්‍යාව කෙරෙහි උනන්දුවක් දක්වූවේය. මෙම වංශවතා තුළ උපන් පුරෝගාමී සංකල්ප ඔහුව විප්ලවීය විද්‍යාඥයෙකු බවට පත් කළේ ඔහු තුළ වූ උනන්දුව ප්‍රබල ආවේග බවට පරිණාමනය වූ බැවිනි. මූලික වශයෙන්ම රාජ්‍ය තාන්ත්‍රික දේශපාලනඥයෙකු වූ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් ස්වභාවධර්මය සතු වූ විස්මිත බව පිළිබඳ ඉමහත් කුතුහලයක් දක්වීය. මේ සියලු ස්වභාවවාදීන් මැනවින් ලේඛන කටයුතුවල නියැලුනහ. එසේම ඔවුන් විසූ යුගයට ගැලපෙන සාහිත්‍යමය භාෂාවකින් ලියූහ. ඒ කොතරම් ද යත් චාර්ල්ස් ඩාවින් විසින් රචනා කළ 'ජීවීන්ගේ සම්භවය' නම් වූ ජනප්‍රිය කෘතිය එයට වඩා හොඳින් ''ශාස්ත්‍රීය ලෙස'' හෝ ''ජනප්‍රිය ලෙස'' රචනා කළ නොහැකි බව බොහෝ දෙනාගේ විශ්වාසය ය. එපරිද්දෙන්ම බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් රචිත ඍජු සහ ප්‍රබල ගද්‍ය නිර්මාණ සර්වග්‍රාමී හෙවත් ඕනෑම අයෙකු හට තේරුම් ගත හැකි තත්වයක පවතින බව පිළි ගැනෙයි.

**භෞතිකමය නියම පිළිබඳ අපගේ අවබෝධය ඉහළ යාමත් ඒ හා සමගම රසායන සහ ජෛවීය විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව වූ අපගේ දැනුම ඉහළ යාමත්, හේතු කොට මෙයට පෙර යොදා ගත් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් විද්‍යාව උපයෝගී කර ගැනීමට හැකි වී ඇත.**

නිසැකවශයෙන්ම, මෙවැනි මහත්මා විද්‍යාඥයන් අත්පත්කරගත් ප්‍රගතිය 'විද්‍යාව' පිළිබඳ පැහැදිලි නිර්වචනයක් සැපයීමටත් සමත් වින. එ පමණක් නොව එකිනෙකාට සීමා වූ මූලධර්ම, නීති හා රීති සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, භූ විද්‍යාව හා ජීව විද්‍යාව වශයෙන් විද්‍යාව කුටීර තුළට වෙන් කර ප්‍රවර්ග කිරීමටත් එමගින් හැකි විය. එලෙසම දැනුම සහ විද්‍යාව කේන්ද්‍ර ගත වීම, සහ විශේෂිත වීම ද සිදු විය. භෞතිකමය නියම පිළිබඳ අපගේ අවබෝධය ඉහළ යාමත් ඒ හා සමගම රසායන සහ ජෛවීය විද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව වූ අපගේ දැනුම ඉහළ යාමත්, හේතු කොට මෙයට පෙර යොදා ගත් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් විද්‍යාව උපයෝගී කර ගැනීමට හැකි වී ඇත. එතෙක් තාක්ෂණය, විද්‍යාව ඉදිරියට මෙහෙයවූ අතර කුතුහලය විසින් විද්‍යාව ජනනය කරනු ලැබීය. දැන් නව යෙදවුම් සඳහා සහ නව තාක්ෂණ බිහි කිරීම සඳහා විද්‍යාව භාවිත කිරීමට හැකිව තිබේ. මානව සුබ සාධනය, වාණිජමය කටයුතු සහ එදිනෙදා කාර්යයන් සඳහා විද්‍යාව භාවිත කිරීම දැන් පුළුල් අන්දමින් ව්‍යාප්තව ඇත.



**විශ්වය ප්‍රසාරණය වෙමින් පවතී**

මෙහි එක් අතුරු ප්‍රතිඵලයක් වූයේ විද්‍යාව සඳහා යොදා ගත් භාෂාව සංකීර්ණ, ශිල්පීය වීමත් එය පොදු මිනිසාට තේරුම් ගත හැකි එදිනෙදා හුරුපුරුදු භාෂා විලාශයෙන් ඈත් වීමත්ය. විද්‍යාව හා තාක්ෂණය තමන්ගේම වාග් ව්‍යවහාර සම්ප්‍රදායක්, දුරවබෝධය ඇති කරන විෂයානු රූප භාෂාවක් සහ විශේෂිත ප්‍රවේශ සංවර්ධනය කර ගැනීම හේතු කොට කාර්ය නියැලි විද්‍යාඥයන් සහ පොදු ජනතාව අතර පරතරය තව දුරටත් දුරස්ථ කිරීමට සමත් විය. එහෙයින් ඩාර්වින්, නිව්ටන් හෝ ෆ්‍රැන්ක්ලින් වැනි විද්‍යාඥයන්ගේ මුල් කෘති කියවා තේරුම් ගත් අන්දමින් වර්තමාන විද්‍යාඥයන්ගේ මුල් කෘති කියවීමට හෝ කියවා වටහා ගැනීමට හෝ සාමාන්‍ය ජනතාවට තවදුරටත් හැකියාව හා අවස්ථාව නොමැති විය. මේ අතර විද්‍යාඥයන් ද තම ශිල්පීය දැනුම තම ශිල්ප-සමාජයට හෝ වෘත්තියට හෝ සීමා වූ විශේෂිත සඟරාවල පළ කිරීමට ද පියවර ගනු ලැබිණ.

විද්‍යාව ජනප්‍රිය ලෙස ප්‍රචලිත කිරීමට සහ සාමාන්‍ය 'ගිහි' ජනතාවට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි ලෙස ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව මතු වූයේ මෙම සන්දර්භය තුළිනි. තම එදිනෙදා ජීවිතයේදී විද්‍යාත්මක වෘත්තීන් හි නියැලෙන අයට පමණක් නොව විද්‍යාත්මක දැනුම සාකච්ඡාවට ලක් කිරීම සහ එය 'ගිහි' පොදු ජනතාව අතරට ගෙන ඒමට විද්‍යාඥයන් වැනි විශිෂ්ට පුද්ගලයන් මගින් විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ නව ප්‍රබෝධයක් ඇති වූයේ ද මෙම සන්දර්භය හේතු කොට ගෙනය. විද්‍යාව යන්න මානව අත්දැකීම් හි අංගයක් මිස නුහුරු විෂයයක් නොවිය යුතුය යන්න මෙම තත්වය පසුබිමෙහි පැවති හැඟීම විය.



**සියලු චලිත එක් නියම සමූහයකින් විස්තර වෙයි**

මෙම තත්වය පසු කර අප බොහෝ දුර පැමිණ සිටින අතර විද්‍යා ලේඛකයාගේ වැදගත්කම වඩ වඩාත් දැනෙන්නට පටන් ගෙන ඇත. වෘත්තිකයන් සහ 'ගිහි' පොදු ජනතාව එකට එක් කිරීමට උත්සාහ දරනුයේ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා නියැලෙන්නවුන්ය. සමකාලීන සමාජය තුළ විද්‍යාව දිගු සහ හරස් නූල් වියමනක ගෙතී පවතියි. විද්‍යාව මානව ක්‍රියාකාරිත්වයේ සංස්කෘතිකමය සංචරකයක තත්වය ඉක්මවා ගොස් ඇත. විද්‍යාත්මක සාක්ෂරතාව යන පදය මේ හා සම්බන්ධව වැඩි වැඩියෙන් භාවිත වෙයි. ජීවිතයේ උපරිම ඵල නෙලා ගැනීමට සහ වර්තමාන සමාජයෙහි සක්‍රිය සාමාජිකයෙකු වීමට නම් කෙනෙකු විද්‍යාත්මක සාක්ෂරතාවය සහිත අයෙකු වීම අත්‍යවශ්‍ය ය.

සෑම කෙනෙකු තුළම සංගීතය යනු යම් රිද්මයානුකූල රටාවකට සකස් කරගනු ලබන ඉඳහිට අන්තර 12කට හෝ සමහර අවස්ථාවලදී 20කට වෙන් කරනු ලබන අෂ්ටකයේ මූලික ස්වර 8න් සමන්විත බවට වන සංගීත සාක්ෂරතාව පවතියි. මෙය දැනගැනීම සඳහා අප ක්‍රියාකාරී සංගීතඥයන් විය යුතු නොවේ. එලෙසින්ම මුදල් පිළිබඳව, එහි භාවිතය, බැංකු වල සිදුවන කටයුතු, මුදල් ගනුදෙනුවකදී අලාභයක් සිදු කර නොගැනීමට අවශ්‍ය මූල්‍ය සාක්ෂරතාව අප හිමි කර ගෙන ඇත. එසේම අපට 'විද්‍යා සාක්ෂරතාව' ලද හැකිද? මෙම ප්‍රශ්නය විද්‍යාඥයන් දෙදෙනෙකු තුළ යම් කුහුලක් ඇති කිරීමට සමත් විය. ඔවුන් ඇසීමට යොමු වූයේ 'විද්‍යාව අපට ලබා දී ඇති අත්‍යවශ්‍ය සංකල්ප කවරේද? යන ප්‍රශ්නයය. මෙයට දශක දෙකකට පෙර භූ භෞතික විද්‍යාඥ ආචාර්ය රොබර්ට් හේසන් සහ භෞතික විද්‍යාඥ ආචාර්ය ජේම්ස් ට්‍රෙෆිල් යන දෙදෙනා එක්ව ඔවුන් විසින් රචිත ''විද්‍යාත්මක කරුණු' යන කෘතිය තුළින් මෙහි පහත දැක්වෙන මහා සංකල්ප-අදහස් ගෙන හැර දැක්වීය.

**රට වැසියෙකු දැන සිටිය යුතු මූලික නියම සහ මූල ධර්ම දුසිම් දෙකකට-ශ්‍රේෂ්ඨ සංකල්ප 20කට වඩා නොමැත. මෙසේ හැඳින්වූ සංකල්ප 20 මෙසේය.**

(01) විශ්වය ක්‍රමානුකූල (විධිමත්) සහ පෙරැයිය හැකි වූවකි;
(02) සියළු චලිත එක් නියම සමූහයකින් විස්තර වෙයි;
(03) ශක්තිය සංරක්ෂණය වී පවතියි;
(04) ශක්තිය හැම විටම වඩා ප්‍රයෝජනවත් ස්වරූපයක සිට එතරම් ප්‍රයෝජනවත් නොවන ස්වරූපයකට ගලා යයි;
(05) විද්‍යුතය සහ චුම්බකත්වය එකම බලයෙහි අංශ දෙකකි;
(06) සියල්ල තැනී ඇත්තේ පරමාණුවලිනි;
(07) සෑම දෙයක්ම-අංශු, ශක්තිය, ඉලෙක්ට්‍රොන භ්‍රමණ ශීඝ්‍රතාව - වියුත ඒකක වලින් සැපයෙයි. එය වෙනස් නොකර ඔබට කිසිවක් මැනිය නොහැකිය;
(08) ඉලෙක්ට්‍රෝන නම් ''මැලියම්'' මගින් පරමාණු එකට බැඳ තබයි;
(09) ද්‍රව්‍යයක් හැසිරෙන අන්දම එහි පරමාණු ස්කන්ධ ඇති ආකාරය මත රැඳෙයි;
(10) න්‍යෂ්ටික ශක්තිය ලැබෙනුයේ ස්කන්ධය පරිවර්තනය වීම මගිනි;
(11) සෑම දෙයක්ම සත්‍ය වශයෙන්ම තැනී ඇත්තේ ක්වාක (ආනරික්ෂිත අණුපරමාණු වලින් එකක්) සහ ලෙප්ටන වලිනි;
(12) අනෙක් සියල්ලම මෙන්ම තාරකාද ඉපිද නැසී යයි;
(13) විශ්වය අතීතයේ කිසියම් වේලාවක උපත ලබා එවක් පටන්ම ප්‍රසාරණය වෙමින් පවතියි;
(14) සෑම නිරීක්ෂකයෙකුම දකිනුයේ ස්වභාවධර්මයෙහි එකම නියමයන්ය;
(15) පෘථිවියෙහි පෘෂ්ඨය නිරතුරුවම වෙනස්කම්වලට ලක් වෙයි. පෘථිවියෙහි කිසිදු ලක්ෂණයක් ස්ථිරවම නොපවතියි;
(16) පෘථිවිය මත සිදුවන සෑම දෙයක්ම චක්‍රානුකූලව සිදුවෙයි;
(17) සෑම ජීවියෙක්ම, ජීවිතය රසායනික කම්හල් ලෙස සැලකෙන සෛල වලින් තැනී ඇත;
(18) සියලු ජීවයන් එකම ජාන කේතයක් පදනම් කර ගනියි;
(19) සියලු ජීවී ස්වරූප ස්වභාවික වරණය තුළින් පරිණාමය වී ඇත;
(20) සියලු ජීවීන් එකිනෙකට සම්බන්ධය.

මේවා මෙයට වසර විස්සකට පෙර පළ කර ඇති අතරම, බොහෝ දෙනා අතර සාකච්ඡාවට ද ලක්ව ඇත. එසේම ඒවා බොහෝ දෙනා ප්‍රසංශාවට මෙන්ම විවේචනයට ද ලක් කර ඇත. එනමුදු මෙම ශ්‍රේෂ්ඨ සංකල්ප 20ට අතිරේකව අලුත් අදහසක් මේ දක්වා ඉදිරිපත්ව නැත. එබැවින් මෙම කරුණු විද්‍යා සාක්ෂරතාවේ පදනම වන මූලික සංකල්ප සමූහය ලෙස පෙනේ. මෙම රීති පිළිබඳව දැනුමත්, අවබෝධයත් ලැබීම

සහ ඒවා අගයකිරීම තුළින් ප්‍රබුද්ධත්වය සහ සුපෝෂණය වීම ලද හැකිය. ඒ සංගීතය සහ කලාව, ආර්ථිකය, ප්‍රචාරය හෝ ආගම අපගේ එදිනෙදා ජීවිතය ඉහළ තලයකට ගෙන ඒමට සමත් වන බැවිනි. එයට අමතරව විද්‍යාව, අපගේ අගයයන්, විශ්වාස සහ ජීවන රටාවට බලපාන බැවින් එය වඩාත් වැදගත් වෙයි. මෙම තත්වය අගය කිරීම සහ පිළිග ැනීම ජීවිතය විචාරශීලී ප්‍රවේශයක් වෙත යොමු කිරීමට සමත් වෙයි.

**විද්‍යා ලේඛකයා සංස්කෘතීන් දෙකක් අතර සබඳතා ඇති කරන පාලමක් ලෙස කටයුතු කිරීම වැදගත් වන අතරම විද්‍යාවෙහි සමකාලීනව සිදු වන ප්‍රගතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේත් යෙදිය යුතුය.**

ශ්‍රීමත් සී. පී. ස්නෝ පෙන්වා දුන් පරිදි විද්‍යා ලේඛකයා සංස්කෘතීන් දෙකක් අතර සබඳතා ඇති කරන පාලමක් ලෙස කටයුතු කිරීම වැදගත් වන අතරම විද්‍යාවෙහි සමකාලීනව සිදු වන ප්‍රගතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේත් යෙදිය යුතුය. විද්‍යාව ප්‍රචලිත කරන්නා වෙතද වගකීමක් පවතියි. ඔහු ''නරක'' විද්‍යාවෙන් ''හොඳ'' විද්‍යාව පෙරා ගත යුතුය. වංචනික විද්‍යාවෙන් අවංචනික විද්‍යාව තෝරා බේරා ගත යුතුය. ඒ සඳහා ඔහු නිරතුරුවම විද්‍යාව සමග ගැවසෙන්නෙකු විය යුතුය. ඔහු විද්‍යාත්මක කටයුතුවල නියැලෙන්නෙකු හෝ අඩුතරමින් විද්‍යාත්මක සංකල්පය නිපදවන්නෙකු හෝ විශ්ලේෂකයෙකු හෝ වේ නම් එය වඩාත් උචිතය.


**ශ්‍රීමත් සී. පී. ස්නෝ**

නවීන විද්‍යාව පිළිබඳව ජනතාව තුළ පවත්නා සංජානනය දෙආකාරය. එක් අතකින් ජනතාව එය අගය කරයි. අනෙක් අතින් එදෙස සැක සංකාවෙන් යුතුව බලයි. භෞතික විද්‍යාවන් පිළිබඳ දැනුමෙහි ලැබී ඇති ප්‍රගතිය, භූ කේන්ද්‍රීය ආකල්පයන්ගෙන් මුදා ගෙන ඇත. ගැලිලියෝගේ සිට නිව්ටන් දක්වා පැමිණෙන විට සහ විශ්වය පිළිබඳ පැහැදිලි කිරීම් තව දුරටත් ලැබෙන විට විශ්වය තුළ මිනිසා සිටින ස්ථානය බොහෝ වෙනස්කම්වලට ලක්ව ඇත. ඉමහත් වූ විශ්වය තුළ අප ඉතා කුඩා තිතක් බව අවබෝධ කර ගැනීමට එමගින් හැකිවී ඇත. එය අපට නිහතමානීකම උගන්වා ඇත. එසේම එය අප හට තවදුරටත් විප්ලවකාරී ලෙස සිතීමට පෙළඹවීමට සමත්ව ඇත. පෘථිවියෙන් බැහැර බුද්ධිමය ජීවීන් සිටිය හැකි බවටත්, එවැනි පරසක්වල බුද්ධීන් ගැන සොයා යෑමට අපට හැකි වේය යනාදිය එවැනි සිතුවිලි අතර වෙයි. ඉතා කැපී පෙනෙන තාරකා භෞතික විද්‍යාඥයෙකු සහ විද්‍යාව ප්‍රචලිත කරන්නෙකු ලෙස ක්‍රියා කළ ආචාර්ය කාර්ල් සේගාන්, සෙටී (සර්ච් ෆො එක්ස්ට්‍රා ටෙරස්ටියල් ඉන්ටෙලිජන්ස්) ලෙස හැඳින්වෙන එවැනි බුද්ධිමය ජීවීන් පිළිබඳ හඹායාමට මහත් ඕනෑකමක් හා පෙළඹවීමකින් යුතුව යෝජනා කිරීම මෙහිදී සැලකිල්ලට යොමු විය යුතුය. ඔහුගේ ලිපි, රචනා මෙන්ම රූපවාහිනී වැඩසටහන් ද ලෝක ජනතාව සුපෝෂණය කිරීමට සමත්වින. මෙයට අමතරව ආචාර්ය කාල් සේගාන් සිය අවධානය ඔහු විසින් හඳුන්වා දුන් ''භූතයන්'' හෝ විද්‍යාව පිළිබඳව ජනතා සිත් තුළ පවත්නා සැක සංකා හෝ වෙත ද යොමු කළ අයෙකි.


**සියල්ල තැනී ඇත්තේ පරමාණුවලිනි**

නව ජෛවීය විද්‍යාව මෙවැනි ''භූතයන්'' එනම් ක්ලෝනකරවීම, ජාන වෙනස් කිරීම් (ට්‍රාන්ස්ජෙනික්ස්) සම්ප්‍රදායික හුරුපුරුදු නව අකෘතීන් ලෙස හිමිකම් ලියාපදිංචි වීම ආදියෙන් බහුලය. මේවා උදාහරණ කිහිපයක් පමණක් වන නමුත් ඒ කිසිවක් 'භූතයන්' විය නොයුතුය. විද්‍යාව ප්‍රචලිත කිරීමේ නියැලෙන්නන්ගේ කාර්යය විය යුත්තේ මේ එක් එක් 'භූතයා' රැගෙන එහි පරාමිතීන් සහ පිරිවිතර මතුකර දක්වමින් ඒවායෙහි හිතකර හා අහිතකර යන දෙඅංශයේම බලපෑම් සාකච්ඡාවට ලක් කිරීමය. මෙහිදී ඔහුගේ සමාජයීය වගකීම විය යුත්තේ කිසියම් අදහසක්, ආකල්පයක්, ක්‍රමයක්, සංකල්පයක් හෝ ද්‍රව්‍යයක් හෝ වුව යෝග්‍යද යන්න විමසීමත් ඉන් ලැබිය හැකි ප්‍රයෝජන කවරේද යන්න සාකච්ඡාවට ලක් කිරීමත්ය. විද්‍යාවෙහි ප්‍රගතිය ශීඝ්‍රව සිදුවෙයි. සමාජයීය ආකල්ප සහ අදහස් විශේෂයෙන්ම නීතිය හා නෛතික දර්ශනයන්හි වෙනස්වීම් ඇතිවන්නේ එයට වඩා මලානික වූ වේගයකිනි. ඉතා සෙමිනි. පොදු ජනතාවගේ ගනුදෙනුවලදී විද්‍යාවේ බලපෑම විවාදයට ලක් කළ යුතුය. විද්‍යාව ප්‍රචලිත කරන්නන්හට කාර්යභාරය නිසි ලෙස ඉටු කරනු ලැබුයේ නම් ඒ තමන් ඉතා වැදගත් සේවයක් ඉටු කළ බවට ආස්වාදයක් ලද හැකිය.

(ප්‍රංශයේ පැරිස් නුවර දී වර්ෂ 1997 සඳහා වන යුනෙස්කෝ කාලිංග ත්‍යාගය පිරිනැමීමේදී පැවැත්වූ දේශනය අනුසාරයෙන් සැකසින)

***මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන්***

***ප්‍රකට විද්‍යා සන්නිවේදකයෙකු වන ඉන්දීය ජාතික මහාචාර්ය ඩී. බාලසුබ්‍රමනියන් වර්තමානයේ හයිද්‍රාබාද් එල්. වී. ප්‍රසාද් අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරයි. හයිද්‍රාබාද් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු සහ පීඨාධිපතිවරයෙකු වශයෙන් සේවය කළ මෙම කතුවරයා යුනෙස්කෝ මගින් විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා පිරිනමන කාලිංග සම්මානය (1997), ඉන්දියානු රජය මගින් පිරිනමනු ලබන ''පද්මශ්‍රී'' සම්මානය (2002), සහ ප්‍රංශ රජය මගින් ප්‍රදානය කරනු ලබන "Chevalier de L'ordre National de Merite" සම්මානය ඇතුළු සම්මාන රාශියක් හිමිකරගෙන ඇත.***

